## 9 සම වයසේ මිතුරු කණ්ඩායම

සම වයසේ මිතුරන් සමග දරුවා සිටිය යුතුමය. එවිට ඔහු සමාජයේ තමාට හිමි තැන  වටහා ගනී. බෙදා හදා ගැනීම, ඉවසීම, සමාජශීලීබව, ප්‍රශ්නවලට විකල්ප ඇති බව, සවන්දීම, අන් අයට උදව් කිරීම, වැනි සාරධර්ම මත වූ යතාර්ථවාදී ජීවිතයක් ගතකිරීමට පසුබිම ගොඩනැගේ. දරුවා ඇසුරු කරන මිතුරන් පිළිබඳව දෙමාපියන් අවධානයෙන් සිටිය යුතුය.

## 10 ළමා ශ්‍රම භාවිතය

අවු:14 ට අඩු දරුවන් අන්තරායකාරී හා අව:16 අඩු දරුවන් පාසල් පවත්වන කාලය තුලදී රැකියාවකට යොදවන පුද්ගලයා කරනුයේ දඬුවම් ලැබියහැකි වරදකි. ළමයින් මෙහෙකාර සේවයට, කර්මාන්තශාලා වල සේවයට ගනු ලබන හෝ එවැනි තත්වයකට පත් වූ දරුවන් ඔබ දන්නේනම් 1929 ජාතික ළමාරක්ෂක අධිකාරියට හෝ පීස් ආයතනයට දන්වන්න. එය ඔබ දරුවන්හට කරන උදාර මෙහෙවරකි.



## 11 ජංගම දුරකථන භාවිතය

දරුවා හට ජංගම දුරකථනයක් ලබාදීමේදී ඔබ ප්‍රවේශම්විය යුතුය. වෙනත් අයකුමෙන් කථාකිරීම, රැවටීම, තර්ජනය කිරීම, කප්පම් ගැනීම, මුසාබස් පවසා නිවසින් පිටතට ගැනීම. අසභ්‍ය දේ දුරකථනය වෙත එවීම එහි අහිතකර බලපෑම්ය. කෙනෙකු සතුව ඇති දුරකථනයක අසභ්‍ය දේ තිබී සොයා ගතහොත් එය අධිකරණයෙන් දඬුවම් ලැබිය හැකි වරදකි. .

## 12 දරුවන් හා පරිගණකය

පරිගණකය අධ්‍යාපන හා සන්නිවේදන මෙවලමකි. විශේෂයෙන් එයට අන්තර්ජාලය සම්බන්ධ කර ඇති විට සිදුවිය හැකි අනර්ථයන් බොහෝය. එහි දරුවන්ට හිතකර දේ මෙන්ම අහිතකර දේද බොහෝ ඇත. නිවසේ ඇති  පරිගණකය සෑම කෙනෙකුටම පෙනෙන තැනක තබන්න. අසභ්‍ය වෙබ් අඩවි පෙරනයක් ස්ථාපිත කරන්න.

## අපරාධ දැනුම් දීම

ඉහත සඳහන් කළ ඕනෑම තත්වයක් අපරාධයකි. එවැනි අපරාධ අන්තර්ජාලයෙන් හෝ ඕනෑම මාධ්‍යකින් ඉදිරිපත් කිරීම වරදකි. ඉහත අපරාධ ඔබට සිදු වුවහොත් හෝ ඔබ දන්නා හෝ නොදන්නා කෙනෙකුහට සිදු වුවහොත් එම තත්වය වලක්වාලීමට පියවර ගන්න එය ජාතික මෙහෙවරකි.

1. අන්තර්ජාල අපරාධ පරීක්ෂණ
   දෙපාර්තමේන්තුව: 011 2691982
2. ජාතික ළමාරක්ෂක අධිකාරිය: 1929
3. සර්ට් ශ්‍රී ලංකා ආයතනය: 011 2691692
   විද්‍යුත් තැපෑල: slcert@slcert.gov.lk
4. පීස් සංවිධානය 011 2819397/0712733037
   info@ecpatsrilanka.org

### පීස් සංවිධානය (PEaCE)


පරිසරය සහ සැමතැන වෙසෙන
ළමුන් සුරැකීමේ සංවිධානය
Protecting Environment and Children Everywhere

ලිපිනය: අංක 165/2, දුටුගැමුණු වීදිය, කොහුවල
No 165/2, Dutugenunu Street, Kohuwala

| | |
|---|---|
| දුරකථනය / Tel: | 011 2819397 |
| ජංගම / Mobile: | 071 2733037 |
| ෆැක්ස් / Fax : | 011 2768862 |
| විද්‍යුත් තැපෑල/E mail: | info@ecpatsrilanka.org |


# දරුවන් ආරක්ෂා කරගැනීම සඳහා දෙමාපියන් හා වැඩිහිටියන් විසින් පිළිපැදිය යුතු කරුණු

කාලීන අවශ්‍යතා මත දෙමාපියන් විසින්
දැනුවත් විය යුතු කරුණු සම්පිණ්ඩනය කර
"පීස්" සංවිධානය විසින් සකසන ලද ප්‍රකාශනයකි.




පරිසරය සහ සැමතැන වෙසෙන
ළමුන් සුරැකීමේ සංවිධානය "පීස්"

එක්පැට් ශ්‍රී ලංකා

## 1 ශ්‍රී ලංකාවේ වර්තමාන තත්වය

වාර්තාවන්ට අනුව ලංකාවේ දිනකදී දරුවන් 4-6 දක්වා අපයෝජනයවේ. මෙම අවාසනාවන්ත තත්වය හමුවේ ඔබගේ අවදිවීම, දැනුවත්වීම, සහ මැදිහත්වීම සඳහා කාලය පැමිණ ඇත. මේ පිලිබඳව ඔබ දන්නා හඳුනන සියළු දෙනා දැනුවත් කරන්න. ළමයින්ගේ ආරක්‍ෂාව සඳහා සියළු දෙනාගේ සහයෝගය ලබාගන්න.

## 2 දරුවා යනු

වයස අවුරුදු 18 අඩු සෑම තැනැත්තෙක්ම දරුවෙකි. මොවුන් හට අත්දැකීම් අඩු නිසා ඉක්මනින් වරදට යොමුවිය හැකිය. දරුවන් සියළුදෙනා ආරක්‍ෂා කරගැනීම සහ එක සමාන ලෙස සැලකීම වැඩිහිටියන් සතු වගකීමකි. වැඩිහිටියන් විසින් දරුවන් වෙනස් කොට සැලකීම හා අතහැර දැමීම දඬුවම් ලැබිය හැකි වරදකි.

## 3 දරුවා තේරුම් ගැනීම

දරුවන්ගේ අදහස්, හැඟීම් හා දක්‍ෂතා විවිධාකාරය. වරදක් වූවිට දඬුවම් කිරීමෙන් වැළකී දරුවා එසේ නොකරන්නේ මන්දැයි දෙමාපියන් විසින් සොයාබලා තේරුම් ගත යුතුය. දරුවා තුළ ඉගෙනීමට මෙන්ම උපතින් හිමිවී ඇති වෙනත් කුසලතාද ඇත. එම කුසලතා හඳුනාගෙන ඒවා ප්‍රවර්ධනය කරන්න





## 4 අපයොපනය

කායික, මානසික, ලිංගික අපයෝජනය, නොසලකාහැරීම, ළමා ශ්‍රම භාවිතය, බාලවයස් විවාහ, නිරුවත් ඡායාරූප ගැනීම, සහ අන්තර්ජාල අවභාවිතය යනු අපයෝජනයන් වේ. ආගන්තුකයින්, හිත මිතුරන්, පවුලේ නෑදෑයින්, අසල්වැසියන්, ගුරුවරුන්, පුහුණු කරුවන්, භාරකරුවන්, ආදී ඕනෑම අයෙකුගෙන් ඔබගේ දරුවා ඕනෑම අවස්ථාවකදී අපයෝජනය විය හැකිය. අවධානයෙන් සිටින්න.

## 5 අවධානය හා ආදරය

ඇතැම් දරුවන් පාසැල් යාමට හෝ ඉගෙනීමට මැලිවීම, නිතර කෝපවීම, ආතතිය, තනිවී සිටීමට ඇති කැමැත්ත, තම සිරුරට හානි කරගැනීම වැනි අසාමාන්‍ය චර්යා රටා අපයෝජනයට ලක්වූ දරුවකුගෙන් දිස්විය හැකිය. මෙවැනි තත්වයක් ඇතිවූ විටදී ඒ පිළිබඳ දරුවාගෙන් ඇසිය යුත්තේ ඉතා කල්පනාකාරීවය. මනෝ විද්‍යා උපදේශකයකු වෙත යොමුකිරීම වැදගත්වේ.

## 6 පාසල හා දරුවා

ගුරු දෙගුරු සම්බන්ධතාවය ඔබේ දරුවාගේ ආරක්‍ෂවට රිජුව බලපායි. ඒ තුලින් දරුවා හා ගුරුවරයා අතර මනා බැඳීමක් ඇතිවේ. එම බැඳීම ඔබගේ දරුවාට පාසල ප්‍රිය ජනක ස්ථානයක් බවට පත් කරයි.

## 7 කෲරත්වයෙන් සැලකීම

භාරකාරත්වයේ සිටින දරුවකුහට කායික, මානසික, ලිංගික, නොසලකාහැරීම, හෝ කෲරත්වයෙන් සැලකීම වරදකි. මෙය ක්‍රියාවෙන් වචනයෙන් හෝ ඉඟියෙන් විය හැකිය. දරුවා මානසිකව කම්පනයකට පත්වී ඇති බව අධිකරණ වෛද්‍යවරයා නිර්දේශ කලහොත් දෙමාපියන් ඇතුළු භාරකාරත්වය දරන ඕනෑම කෙනෙකුහට අවු: 7 දක්වා වූ බරපතල වැඩ ඇති සිරදඬුවමක් හිමිවේ.



## 8 උපකාරක පංති

උපකාරක පන්තිවලට  භාරදීම තුලින් දරුවාගේ භාරකාරත්-වය ගුරුවරයාට හිමිවේ. ගුරුවරයාගේ භාරයේ සිටියදී දරුවකුහට අපයෝජනයක් සිදුවුවහොත් භාරකාරත්වය දරන ගුරුවරයා ඊට වගකිය යුතුවේ. එය කායික, මානසික, ලිංගික හෝ නොසලකාහැරීම විය හැකිය. මේවා ක්‍රියාවෙන් වචනයෙන් හෝ ඉඟියෙන් විය හැකිය. මෙවැන්නකට වරදකරු වුවහොත් අවුරුදු 7 දක්වා වූ සිරදඬුවමක් හිමිවේ.

